වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

ஆம் ஆண்டிற்கான செயற்சாதனை அறிக்கை - 2022

Annual Performance Report - 2022










கீடா සංවර්ධන දෙපාර්තමේන්තුව

விளையாட்டு அ பிவிருத்தித் திணைக்களம்

Department of Sports Development

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

අංක 09 පිලිප් ගුණවර්ධන මාවත

කොළඹ 07

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම **:- ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

වැය ශීර්ෂ අංකය **:- 219**

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව 1970 දී අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.

නිරෝගිමත් ක්‍රියාශීලි සමාජයක් උදෙසා ක්‍රීඩා සංස්කෘතියක් සහ විනයගරුක බව තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කරමින් ක්‍රීඩාවේ උන්නතිය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව දැනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ක්‍රීඩාවේ සංවර්ධනය තුළින් ආසියාවේ අභිමානවත් ජාතියක් බවට පත්වීම.

මෙහෙවර

ක්‍රීඩාවේ යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනයට අදාල උපාය මාර්ගික මෙහෙයුම් ක්‍රියාවට නැගීම තුළින් ක්‍රීඩා සංස්කෘතියක් බිහිකිරීමත්, නිරෝගී, විනයගරුක ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහිකිරීම මගින් රටේ සංවර්ධනය ළඟා කර ගනිමින් ශ්‍රී ලංකාව ආසියාවේ අභිමානවත් ජාතිය බවට පත්කිරීම.

අරමුණු

01. සමාජයේ සියළුම අංශවලට ක්‍රීඩාවට අවකාශය ලබා දීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායිතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.
02. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහණ අත් කර ගැනීම.
03. ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙන යා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.
04. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.
05. ක්‍රීඩා සංගම් නියාමනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රමිතීන් ඇති කිරීම.

1.3. සංවිධාන සටහන



Department of Sports Development
Director General
Director (Planning)
Director (Admin)
Chief Internal Auditor
Chief Accountant
Director (Sports)
Director (Engineer)
Asst. Director (Admin)
Accountant
Accountant
Asst. Director (Sports)
Asst. Director (Sports)
Deputy Director (Sports)
Asst. Director (Sports)
Engineer
Administrative Officer
Headquarters Sports Officer
ICT Officer
Translator
D. O.
Planning & Programme Asst.
D. O.
Human Resource Development Asst.
D. O.
D. O.
D. O.
Curator
D. O.
D. O.
D. O.
Planning & Programme Asst.
Sports Coach
Technical Officer
Sport Officer
Asst. ICT Officer
M.S.O.
M.S.O.
M.S.O.
M.S.O.
M.S.O.
M.S.O.
M.S.O.
Warden
Asst. Warden
Ground Clerk
Exercise Assistant
Driving Service
Driving Service
Cook
O.E.S.
O.E.S.
O.E.S.
O.E.S.
O.E.S.
Asst. Cook
Ground Assistant
Life Guard
O.E.S.
O.E.S.
D. O.
M.S.O.
O.E.S.
Planning & Programme Asst.

1.4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
- පාලන අංශය
- ගිණුම් අංශය
- සැලසුම් අංශය
- සංවර්ධන අංශය
- ක්‍රීඩා අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ප්‍රසම්පාදන අංශය

1.5. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්

රජයේ ඒකාබද්ධ අරමුදල්

1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාළ නොවේ

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

<u>2.1 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය</u>

අනු අංකය	වැය ශීර්ෂය	විස්තරය	2022 ප්‍රතිපාදන (රු.මිලි)				2022.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.)			මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
			මුල් ප්‍රතිපාදන	සංශෝධිත ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන සහ මාරු කිරීම් මත ශුද්ධ ප්‍රතිපාදන	ක්‍රී.සං.දෙ	දි.ලේ	එකතුව		
1	2506	යටිතල පහසුකම් සංවර්ධනය	20.000	5.000	10.000	15.000	7.803	3.944	11.747	78%	90.5%
2	17 – 2104 - 66	දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම.	25.000	25.000	130.000	163.705	159.489	0.000	159.489	97%	93%
	46	බර්නාඩ් අළුවිහාරේ ක්‍රීඩාංගණය - මාතලේ මීටර් 400 ධාවන පථය	10.000	10.000	0.000	1.295	0.000	0.000	0.000	0%	40%
3	29 - 2104	කල්මුණේ සන්දංගනී ගෘහස්ථ ක්‍රීඩාගාරය වැඩිදියුණු කිරීම	10.000	5.000	0.000	5.000	0.000	0.000	0.000	0%	22%

අනු අංකය	වැය ශීර්ෂය	විස්තරය	2022 ප්‍රතිපාදන (රු.මිලි)				2022.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.)			මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
			මුල් ප්‍රතිපාදන	සංශෝධිත ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන සහ මාරු කිරීම් මත ශුද්ධ ප්‍රතිපාදන	ක්‍රී.සං.දෙ	දි. ලේ	එකතුව		
4	2 – 1409	**දක්ෂතා සංවර්ධනය**									
	85.	ක්‍රීඩා සංගම් සඳහා දායකත්වය	100.000	20.000	67.716	100.557	88.130	1.500	89.630	89%	98%
	86.	ක්‍රීඩා ශක්ති	100.000	20.000	37.802	57.802	47.836	-	47.836	83%	73%
	87.	ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟාවලි	100.000	20.000	12.074	32.074	31.138	-	31.138	97%	75%
	89.	ජාතික මහා ක්‍රීඩා උළෙල	50.000	20.000	21.518	45.518	45.304	0.008	45.312	100 %	77%
	95.	ගමෙන් රටට ක්‍රීඩකයෙක්	10.000	5.000	0.000	5.000	0.271	0.871	1.142	22%	60%
	96.	ක්‍රීඩා ආර්ථිකය දියුණු කිරීම	50.000	25.000	0.000	25.000	3.401	1.720	5.121	20%	35%
	100.	සෞඛ්‍ය සම්පන්න සමාජයක් සඳහා යෝග්‍යතාව	10.000	2.000	0.000	2.000	1.277	0.100	1.377	69%	15%
	101.	ඔලිම්පික් සඳහා මාවත	100.000	50.000	0.000	32.996	3.781	12.112	15.893	48%	26%

2.1.1. විශේෂ ජයග්‍රහණ

අංකය (1)	ක්‍රීඩා තරඟාවලියේ නම (2)	පැවැත් වූ රට (3)	ක්‍රීඩාව (4)	බර පංතිය (5)	ඉසව්ව (6)	ක්‍රීඩකයාගේ නම (7)	දක්ෂතාව (රන්,රිදී, ලෝකඩ, ශූරතාව, අනු ශූරතාව (8)
01.	විවෘත සුපර් 100 බැඩ්මින්ටන් තරඟාවලිය	ඉන්දියාව, ලක්නව්	බැඩ්මින්ටන්	-	මිශ්‍ර යුගල	සචින් ඩයස් සහ තිලිණි හෙන්දහේවා	ශූරතාවය
02.	සිංගප්පූරු බර ඉසිලීමේ තරඟාවලිය	සිංගප්පූරුව	බර ඉසිලීම	කි.ග්‍රෑ. 73	-	ඉන්දික දිසානායක	රන් පදක්කම
				කි.ග්‍රෑ. 67	-	චතුරංග ලක්මාල්	රන් පදක්කම
				කි.ග්‍රෑ. 49	-	ශ්‍රීමාලි සමරකෝන්	රන් පදක්කම
				කි.ග්‍රෑ. 55	-	දිලංක ඉසුරු කුමාර	ලෝකඩ පදක්කම
03.	පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උලෙළ	එංගලන්තය, බර්මින්හැම්	කවපෙත්ත විසිකිරීම	-	F42-44/61-64	එච්.ජී.පාලිත බණ්ඩාර	රිදී පදක්කම
			බර ඉසිලීම	කි.ග්‍රෑ 225	ස්නැච් ක්‍රමයට සහ ක්ලීන් ඇන්ඩ් ජර්ක් ක්‍රමයට	වයි.ඩී.අයි. කුමාර	ලෝකඩ පදක්කම
			මළල ක්‍රීඩා	-	මීටර් 100	යුපුන් අබේකෝන්	ලෝකඩ පදක්කම
			මල්ලවපොර (කාන්තා)	කි.ග්‍රෑ. 57	-	නෙත්මි අහිංසා	ලෝකඩ පදක්කම

අංකය (1)	ක්‍රීඩා තරඟාවලියේ නම (2)	පැවැත් වූ රට (3)	ක්‍රීඩාව (4)	බර පංතිය (5)	ඉසව්ව (6)	ක්‍රීඩකයාගේ නම (7)	දක්ෂතාව (රන්,රිදී, ලෝකඩ, ශූරතාව, අනු ශූරතාව (8)
04.	ආසියානු කුසලාන ක්‍රිකට් තරඟාවලිය	ඩුබායි සහ සාජා	ක්‍රිකට්	-	-	ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම	ශූරතාවය
05.	2022 ආසියානු දැල්පන්දු ශූරතාවලිය	සිංගප්පූරුව	දැල්පන්දු	-	-	ශ්‍රී ලංකා ජාතික දැල්පන්දු කණ්ඩායම	ශූරතාවය
06.	2022 දකුණු ආසියානු කණිෂ්ඨ බැඩ්මින්ටන් ශූරතාවලිය	ඉන්දියාවේ, ගුහාටිහි	බැඩ්මින්ටන්	-	-	වයස අවුරුදු 15 න් පහළ කණ්ඩායම	රිදී පදක්කම
					-	වයස අවුරුදු 17න් පහළ කණ්ඩායම	රිදී පදක්කම
					පිරිමි (යුගල)	වයස අවුරුදු 17 න් පහළ කණ්ඩායම	රිදී පදක්කම
					ගැහැණු (යුගල)	වයස අවුරුදු 15 න් පහළ කණ්ඩායම	රිදී පදක්කම
					කේවල	කේවල තරඟ	ලෝකඩ පදක්කම් 08

2.1.2 ඉදිරි ඉලක්ක

01. 2024, 2028, සහ 2032 ඔලිම්පික් සහ ජාත්‍යන්තර තරඟාවලිවල පදක්කම් ඉලක්ක කරගෙන දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් සහජ දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන අඛණ්ඩ පුහුණුව ලබා දීම සඳහා සංචිතගත කිරීම.

(අ). ගමෙන් රටට ක්‍රීඩකයෙක් වැඩසටහන - ප්‍රමුඛ සංචිතය
(ආ). ක්‍රීඩා ශක්ති වැඩසටහන - සංවර්ධන සංචිතය, යොවුන් හා කණිෂ්ඨ සංචිතය
(ඇ). ඔලිම්පික් සඳහා මාවත (Road to Olympic) වැඩසටහන - උසස් දක්ෂතා සංචිතය, ජාතික සංචිතය

02. රටේ ජාතික ආර්ථිකයට සවියක් වීම පිණිස ක්‍රීඩා ආර්ථිකය ඉහල නැංවීමේ අරමුණින් සංචාරක ආකර්ෂණය වර්ධනය වන ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම හා විදේශීය රැකියා වෙළඳපොල ඉලක්ක කරගෙන ක්‍රීඩා ආශ්‍රිත රැකියා සඳහා තරුණ පිරිස යොමු කිරීම.

03. සෞඛ්‍ය සම්පන්න නිරෝගී ජන සමාජයක් ඇති කිරීම අරමුණු කොටගෙන ශරීර සුවතා සමාජ පිහිටුවීම සහ විවෘත ශරීර සුවතා මධ්‍යස්ථාන ඇති කිරීම.

04. දැනට ඉදිකෙරෙමින් පවතින කිලිනොච්චිය, සබරගමුව යන පළාත් ක්‍රීඩා සංකීර්ණ, වවුනියාව, මාතලේ, ගම්පහ යන දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ අංග සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණ ලෙස නිම කිරීම.



අධ්‍යක්ෂ ජනරාල්

03. පරිච්ඡේදය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



එස්ජී-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්ජී-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		795,850,000	1,544,232,000	එස්ජී-3
-	තැන්පතු		42,012,628	81,891,580	එස්ජී-4
-	අත්තිකාරම් ගිණුම්		12,981,267	12,930,554	එස්ජී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**850,843,895**	1,639,054,134	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**850,843,895**	1,639,054,134	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	105,175,795	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		850,843,895	1,533,878,339	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
215,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	193,121,829	182,417,050	
561,119,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	426,195,254	436,548,782	එස්ජී-2(ii)
1,950,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,154,399	1,322,413	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
778,569,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**620,471,482**	620,288,245	
	මූලධන වියදම්				
8,217,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	7,046,224	34,633,480	
177,064,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	160,825,896	676,949,937	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එස්ජී-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,750,000	හැකියා වර්ධනය	14	1,183,130	1,317,847	
15,500,000	වෙනත් මූලධන වියදම්	15	11,990,070	187,203,948	
202,531,000	මුළු මූලධන වියදම් (උ)		**181,045,320**	900,105,212	
	තැන්පතු ගෙවීම්		96,747,221	30,774,057	එස්ජී-4
	අත්තිකාරම් ගෙවීම්		11,109,118	14,190,702	එස්ජී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		107,856,339	44,964,759	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		909,373,140	1,565,358,216	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(58,529,245)	(31,479,877)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(58,529,245)	(31,479,877)	එස්ජී-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		එස්ජී-3
			(0)	(0)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	3,877,451,950	3,716,665,055
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	108,384,791	110,256,940
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**3,985,836,741**	**3,826,921,995**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(104,602,825)	(157,465,268)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,877,451,950	3,716,665,054
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	69,349,972	69,349,972
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	143,637,644	198,372,237
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**3,985,836,741**	**3,826,921,995**

පිටු අංක 01 සිට 46 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 47 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 24/02/2023
දිනය : 24/02/2023	දිනය : 24/02/2023	

K. Mahesan
Secretary
Ministry of Sports and Youth Affairs
No.09, Philip Gunawardhana Mawatha,
Colombo 07

අමල් එදිරිසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක : 09, පිලිප් ගුණවර්ධන මාවත
කොළඹ 07.

ඩී.ඩී.එන්. ඇන්ජලෝ පාලිත
ප්‍රධාන ගණකාධිකාරී
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
කොළඹ 07
දු.අංක: 011 2697001, 0714276009

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	නත්‍ය	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	32,764,256	28,905,085
අග්‍රිම ලැබීම්	795,850,000	1,544,232,000
අත්තිකාරම් අයකර ගැනීම්	10,948,123	12,675,218
තැන්පතු ලැබීම්	42,012,629	81,891,581
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**881,575,007**	**1,667,703,884**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	600,729,738	607,385,055
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	505,633	19,585,198
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	105,175,795
අත්තිකාරම් ගෙවීම්	11,109,118	14,254,002
තැන්පතු ගෙවීම්	96,747,221	30,774,058
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**709,091,709**	**777,174,108**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**172,483,298**	**890,529,776**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	4,578,567	1,662,538
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**4,578,567**	**1,662,538**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	177,061,864	892,192,314
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**177,061,864**	**892,192,314**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(172,483,298)**	**(890,529,776)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව (රු)		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.99.00	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	18,000,000.000	-	24,892,450.74	138%
2002.02.99	පොළී හා අනෙකුත්	1,400,000.000	-	4,578,566.51	327%
2004.01.00	W & OP (රජයේ ආදායම්)	6,000,000.000	-	7,842,075.67	131%
2002.01.00	කුලී ගෙවීම්	140,000.00	-	93,439.98	67%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය **රු.000**

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබී ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	577,100,000.00	778,569,000.00	620,471,481,86	80%
ප්‍රාග්ධන	54,000,000.00	202,531,000.00	181,045,319.85	89%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන **රු.000**

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල% ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරී වැටුප් ගෙවීම	346,390.00	-	346,390.00	98%
02	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය+	සංවර්ධන නිලධාරී වැටුප් ගෙවීම	171,300.00	-	165,337.98	97%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**2022.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	**2022.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	264,547,973.63	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	238,219,711.56	-	-
9153	ඉඩම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	3,374,684,264.81	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SYA/A/DSD/02/22/02 මබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 ජූනි21දින

අධ්‍යක්ෂ ජනරාල්
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2.1 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශ
1.6.1 (ඇ)	දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 09 ක ක්‍රීඩාංගන සහ නේවාසිකාගාර ස්ථාපිත කර ඇති අතර මෙම වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.	මෙම වත්කම් අදාළ වත්කම් ලේඛනයන්හි ගිණුම් ගත කිරීමට ක්‍රියාකල යුතු වීම

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) තක්සේරු වටිනාකම එකතුව රු.29,550,000 ක් වූ වාහන 05 ක් ස්ථාවර වත්කම් ලේඛණයේ ගිණුම්ගත නොකිරීම හා තක්සේරු වටිනාකම එකතුව රු.80,400,000 ක වාහන 08 ක් ස්ථාවර වත්කම් ලේඛණයේ රු.37,800,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වාහනවල වටිනාකම රු.72,150,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත 2021 වර්ෂයේදී පවරා දී ඇති රු.5,800,000ක වටිනා අංක NC-4782 වාහනය ස්ථාවර වත්කම් ලේඛණයෙන් ඉවත් කර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වත්කම් එම වටිනාකමෙන් අධි තක්සේරු වී තිබුණි.

(ඇ) රු. 1,234,085,508 ක් වූ වැඩ නිම කළ ව්‍යාපෘති 22 ක් සහ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිමකර වෙනත් රජයේ ආයතන හා පාසල්වලට භාරදී ඇති රු. 682,624,952 ක්වූ ව්‍යාපෘති 16 ක් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන වැඩවල ඇතුළත් කර තිබීම හේතුවෙන් කෙරීගෙන වැඩ රු 1,916,710,460 කින් අධි තක්සේරු වී තිබුණි.

(ඇ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ස්ථාන 5ක සහ සියළු ක්‍රීඩා සංකීර්ණවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම 2022 දෙසැම්බර් 31 දින වන විට තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

1.6.2 කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම

උඟව පළාත් ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිකිරීම සඳහා අවස්ථා දෙකකදී ලබා දුන් අත්තිකාරම් මුදලින් පියවා තිබුණු රු. 5,717,503 ක් සහ එම ශේෂවලට අදාල රු. 857,625 ක්වූ එකතු කළ අගයමත බදු මුදල සමාලෝචිත වර්ෂයේ පියවා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ශේෂයෙන් අඩු කර නොතිබීම හේතුවෙන් කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා සංචිත ගිණුමේ ශේෂය එකතුව රු. 6,575,128 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මූලධන වැය විෂයන් 04 ක එකතුව රු. 7,695,085 ක් වූ ප්‍රතිපාදන වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණි. පුනරාවර්තන වැය විෂයයන් 26 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක් බැගින් එකතුව වැය විෂයන් 32 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු පුනරාවර්තන ප්‍රදාන රු. 153,354,884 ක් හා මූලධන ප්‍රදාන රු. 9,573,069 ක් බැගින් එකතුව රු. 162,927,953 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී පැවතුණි. එම ප්‍රතිපාදන ඉතිරිවීම් එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට දක්වා 95 පරාසය තුල පැවතුණි. අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව වියදම් සීමාකිරීම හා කාර්තු අවසානයේ භාවිතා නොකළ ප්‍රතිපාදන ශූන්‍ය වන පරිදි ප්‍රතිපාදන සලසා තිබීම හා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගන්නා ප්‍රතිපාදන මගින් කෙටි කාලයක් තුල ප්‍රසම්පාදන කටයුතු හා අනෙකුත් කාර්යයන් සැලසුම් කිරීමට නොහැකි වීම මේ සඳහා හේතූන් ලෙස දක්වා තිබුණි.

2.2 අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගෙන බැඳීම් හා බැරකම් සඳහා එළඹීම

(අ) 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුලත් රු.8,910,048 ක බැරකම් වලින් රු.8,620,695 ක බැරකම් විගණිත දින වන විට නිරවුල් කර නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 01 ඡේදය පරිදි 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් හා බැරකම්වලට එළඹීම වැලැක්වීමට උපදෙස් ලබා දී තිබුණද, 2022 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස හඳුනානොගත් එකතුව රු. 13,672,980 ක වියදම් 02 ක් 2023 වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශයට ලැබී තිබූ එකතුව රු. 109,959,692 ක බිල්පත් 26ක් මුල්‍ය ප්‍රකාශන වාර්තාවන්හි හා භාණ්ඩාගාර SA-92 වාර්තාවන්හි බැරකම් ලෙස පෙන්වා නොතිබුණි

2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

2022 දෙසැම්බර් 31 දිනට වූ අත්තිකාරම් "බී" ගිණුමට අනුව නිලධාරීන් දෙදෙනෙකුගේ හිහහිට තිබුණු ශේෂවල එකතුව රු.218,082 ක් වූ අතර එම ණය ශේෂ අතර වර්ෂ 9 ක් පැරණි සේවය අතහැර ගිය නිළධාරියකුගෙන් අයවිය යුතු රු. 35,600ක් සහ වර්ෂ 17 ක් පැරණි මිය ගිය නිළධාරියකුගෙන් අයවිය යුතු රු. 58,450ක ණය පැවතුණි. මිය ගිය නිළධාරියාගේ ණය ගොණුව ලේඛණාගාරයේ නොතිබීම හා සේවා කාලය අවුරුදු 05 සම්පූර්ණ නොවීම හේතුවෙන් එම ණය මුදල මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට ද නොහැකි වූ අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවද කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු

(අ) වර්ෂ 02 සිට 06 දක්වා පැවති රු.37,794,601 ක් සහ වර්ෂ 6 ට වඩා පැරණි රු.2,103,059 ක්වූ කොන්ත්‍රාත් තැන්පතු 72 ක් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට නිදහස් කර නොතිබුණි.

(ආ) තැන්පත් ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති වර්ෂ 02 සිට 05 දක්වා හා වර්ෂ 5 ට වඩා පැරණි එකතුව රු. 17,592,620 ක් වටිනා කොන්ත්‍රාත් තැන්පතු 42 ක් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල නඩත්තු කාල සීමාව ඉක්මවා තිබුණද අඩුපාඩු සකස්කර නොමැති වීම, නිරවුල් කිරීම සඳහා නිර්දේශ ලබා නොගැනීම හා අවසන් බිල්පත් ඉදිරිපත් නොවීම යනාදි හේතූන් මත රැඳවුම් මුදල් නිදහස් කර නොතිබුණි.

2.5 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි වේ.

නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ	එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයක් වෙනුවෙන්ම ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු ඒ සී ඒ-2(ii) ආකෘතියෙහි

දැක්විය යුතු වුවත් වැය විෂය සංකේතාංකයන් 07 ක් සඳහා ප්‍රතිපාදන ඉතිරියට හේතු දක්වා නොතිබුණි.

දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවල වැය විෂය සංකේතාංකයන් 2 ක් සඳහා ප්‍රතිපාදන ඉතිරි ප්‍රතිශතය දක්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

.----------

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,140 ක් සහ 2022 දෙසැම්බර් 31 දිනට වියදම රු.මිලියන 324ක් වූ පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 7 ක් ප්‍රතිපාදන නොමැති වීම, කොන්ත්‍රාත් හා උපදේශක ආයතන සමග ඇති වූ ගැටලුකාරී තත්වයන් යනාදි හේතූන් මත වැඩ නිම නොකර ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි.

3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන ආ ව්‍යාපෘති 6 ක ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 530 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට වැයකර ඇති වියදම රු. මිලියන 315 ක් විය. අමුද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම හා ප්‍රතිපාදන සලසා ගැනීමේ දුෂ්කරතාවයන් හේතුවෙන් මෙම ව්‍යාපෘති නිම කිරීම ප්‍රමාද වී තිබුණු අතර ඒ අනුව මෙම ව්‍යාපෘති සඳහා මෙතෙක් වැයකර ඇති වියදමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගෙන නොතිබුණි.

3.3 කාල පමාවකින් පසු ආරම්භ කළ ව්‍යාපෘති

(අ) කල්මුණේ සන්ධාංගනී ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

කල්මුණේ සන්ධාංගනී ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ත ක්‍රීඩාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 155 ක්වූ බදු රහිත අගයකට 2019 වර්ෂයේදී ඉදිකිරීම් ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2020 නොවැම්බර් 14 දින වන විට නිමකල යුතුව පැවති අතර 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම කොන්ත්‍රාත්තුව සඳහා රු.මිලියන 46 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම හේතුවෙන් මෙම ඉදිකිරීම් පරිශ්‍රයට වෙනත් ක්‍රීඩාපිටි ඇතුලත්ව තිබුණු බැවින් ප්‍රදේශයේ ක්‍රීඩා සමිති මගින් බාධා ඇතිවීම හේතුවෙන් යාබද ඉඩමේ බිම් කොටසක් එකතු කර, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වී 2021 මාර්තු 22 දින ආරම්භ කර තිබුණි.

2020 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා රු.31,045,976 ක් වූ (බදු මුදල් රහිත) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම අගයෙන් රු.14,647,650 ක් අය කර ගත යුතුව පැවතුණි. ව්‍යාපෘති කාලය 2022 මැයි 15 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර ගෙවන ලද අත්තිකාරම් මුදලට සරිලන සේ වැඩ කොටස් ඉටුකර භාරදීමට කොන්ත්‍රාත්කරු එකඟ වී තිබුණි. කොන්ත්‍රාත්තුවේ මිල උච්චාවචනයක් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු එකඟ නොවීම හේතුවෙන් ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණ අතර ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි. .

(ආ) **වයඹ පලාත් ක්‍රීඩා සංකීර්ණයේ (බිංගිරිය) පිහිනුම් තටාකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

වයඹ පලාත් ක්‍රීඩා සංකීර්ණයේ (බිංගිරිය) පිහිනුම් තටාකය ඉදිකිරීමේ කටයුතු රු.84,399,475 ක්වූ (බදු රහිත) අගයකට 2017 ජනවාරි 03 දින පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත වසරක කාලයක් තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට රු.91,585,968 ක් (බදු සහිත) කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

2017 වර්ෂයේ ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ අතර එම වර්ෂයේදී වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.16,879,895 ක් ගෙවා තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු වෙත රු. 16,441,574 ක් ගෙවිය යුතුව පැවතුණි. ව්‍යාපෘතියේ මිල විවලනයන් සඳහා 2023 මැයි 31 දින වන විටද අනුමැතිය ලබා ගෙන නොතිබුණ අතර පිහිනුම් තටාකයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණු බැවින් ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) **මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ගෘහස්ථ ක්‍රීඩාගාරය හා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.107,459,940 ක්වූ බදු රහිත අගයකට 2015 වර්ෂයේදී පුද්ගලික ඉදිකිරීම් ආයතනයක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාලසීමාව මාස 09 ක් වන අතර 2016 මැයි 03 වන විට අදාළ ඉදිකිරීම නිම කල යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් මස 31 දිනට රු. 61,335,327 ක් වැයකර තිබුණු අතර අංක 03/2022 ජාතික අයවැය වක්‍රලේඛය අනුව වියදම් සීමා කිරීම් හා කොන්ත්‍රාත් ආයතනය බුන්වත් වීම හේතුවෙන් පිහිනුම් තටාකයේ වැඩ නතර කර තිබුණි. මේ අනුව මෙම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) **මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතිය**

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පිහිනුම් තටාකය හා ප්‍රේක්ෂකාගාරයේ කොන්ත්‍රාත් වටිනාකම රු. 53,139,423 ක් වූ ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේදි පුද්ගලික ඉදිකිරීම් සමාගමක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාල සීමාව මාස 09 ක් වන අතර 2016 මැයි 03 දින වන විට ඉදිකිරීම කටයුතු නිම කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකරන භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබුණි. 2019 පෙබරවාරි 07 දින නැවත වැඩ ආරම්භ කිරීමට අවසර ලබාදී තිබුණද 2022 දෙසැම්බර් 31 දිනට මෙම ඉදිකිරීම උදෙසා රු. 34,928,554 ක් වැය කර තිබුණි. අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් සීමා කිරීම, රටේ පවතින ආර්ථික තත්වය හා භාණ්ඩවල මිලගණන් ඉහලයාම හේතුවෙන් පිහිනුම් තටාකයේ වැඩ කොන්ත්‍රාත්කරු විසින් නතර කර තිබුණු අතර මේ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගෙන නොතිබුණි.

(ඉ) **මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.81,877,205ක්වූ කොන්ත්‍රාත් වටිනාකමට 2015 වර්ෂයේදී ඉදිකිරීම් ආයතනයක් වෙත ලබා දී තිබුණි. කොන්ත්‍රාත් කාලය මාස 09 ක් වන අතර ඒ අනුව 2016 මැයි 03 දින ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිය සිදුකරන භූමිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමියක් වීම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට උපදෙස් දී තිබුණි. 2019 පෙබරවාරි 07 දින වැඩ ආරම්භ කිරීමට අවසර ලබා දී තිබුණ ද එම දිනයේ සිට වලංගු කාලය ඉක්මවා වසර 03 ක් ගත වුවද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රු.54,400,572 ක් වැයකර තිබුණද ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

3.4 අපේක්ෂිත ප්‍රතිලාභ(outcome) ලබා නොගැනීම

2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග 7 (xii) අනුව ජාතික ක්‍රීඩා සංගම් විසින් එළඹෙන වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එකී ක්‍රියාකාරී සැලැස්ම පවත්නා වර්ෂය අවසන් වීමට මාස තුනකට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2022 වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා සංගම් 66 කින් ක්‍රීඩා සංගම් 11 කින් පමණක් ක්‍රියාකාරී සැලසුම් දෙපාර්තුමේන්තුව විසින් ලබාගෙන තිබුණි.

4 මානව සම්පත් කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 12 ක්ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 62 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 20 ක්ද පැවතුණු අතර එය තුළ ඇතුළත් දෙපාර්තමේන්තුවේ සහ ක්‍රීඩා ක්ෂේත්‍රයේ කාර්යසාධනය සඳහා බෙහෙවින් බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සහ ක්‍රීඩා කටයුතු සම්බන්ධ කාර්යමණ්ඩලයේ තනතුරු 7 කට අදාළ පුරප්පාඩු 47 ක් පැවති බව නිරීක්ෂණය විය.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
අදාල වර්ෂය තුළ නිමකල ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රමාණය	_	_	√
අන්තර්ජාතික පදක්කම් ප්‍රමාණය	_	_	√

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	**50 % - 74%**	**75% - 100%**
දිලිදුකමින්, කුසගින්නෙන් හා ලෙඩරෝග වලින් තොර, අවශ්‍යතා සැපිරූ හා සියළු ජීවිත සමෘද්ධිමත් කිරීම.	ශාරීරික යෝග්‍යතා සමාජ ඇති කිරීම	මහජන ශාරීරික යෝග්‍යතාවය උදෙසා පැවැත් වූ වැඩසටහන් ප්‍රමාණය	√	_	_
මනුෂ්‍යයාගේ සමස්ත හැකියාව ළඟාකර ගැනීමට හා පොදු සශ්‍රීකත්වය ලබාගැනීම සඳහා දායකවීමට සමාන අවස්ථා ලබාදීම.	2028 වන විට ප්‍රධාන ක්‍රීඩා 5කින් ඔලිම්පික් පාරිසාධන මට්ටම කරා ළඟාවීම හා ජයග්‍රහණයක් ලබා ගැනීම	හඳුනාගත් ක්‍රීඩා තරඟාවලින්හි දී සහ ශූරතාවලදී දිනාගත් ජාත්‍යන්තර පදක්කම් ගණන	_	_	_
ළමුන් සඳහා ආයෝජනය කරන සෑම දරුවෙක්ටම ප්‍රචණ්ඩත්වයෙන් තොරව වැඩීමට අවස්ථාව සැලසීම.	ජාතික මට්ටමින් ක්‍රීඩා උළෙල පැවැත්වීම	ජාතික මහා ක්‍රීඩා උළෙල දී පිහිටු වන ලද ශ්‍රී ලංකා වාර්තා ගණන	_	_	_
	දැනට ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන සංඛ්‍යාව වාර්ෂිකව 20% කින් ඉහළ නැංවීම	ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයට ගන්නා පුද්ගලයින් ප්‍රමාණය	√	_	_
	සියළුම ක්‍රීඩා සංගම් ගිණුම් වාර්තා ඉදිරිපත් කර නිලවරණ පවත්වා පනතට අනුගත කිරීම	ක්‍රීඩා පනතේ විධිවිධානයන්ට අනුගත වන ක්‍රීඩා සංගම් ප්‍රතිශතය	_	_	√

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50 % - 74%	75% - 100%
	අන්තර්ජාතික පදක්කම් ලබා ගත හැකි ක්‍රීඩකයන්ගේ ප්‍රතිශතය 40%කින් ඉහළ නැංවීම	දෙපාර්තමේන්තු පුහුණුකරුවන් විසින් හඳුනා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කර අන්තර්ජාතික පදක්කම් ලබා ගැනීමට ඉදිරිපත් කළ හැකි ක්‍රීඩකයින්ගේ ප්‍රතිශතය	√	–	–

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජයග්‍රහණ :

- 22 වන වරට එංගලන්තයේ බර්මින්හැම් නුවර පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උලෙළේ දී ලක් මාතාවට ලෝකඩ පදක්කම් 03 ක් සහ එක් රිදී පදක්කමක් වශයෙන් පදක්කම් 04 ක් දිනා දීමට ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වීම.

අභියෝග :

- 2022 වර්ෂය සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන අවුරා තැබීම.
- කාර්තුමය අයවැය ප්‍රතිපාදන ලැබීම මත අවශ්‍ය අවස්ථාවන්හි දී අග්‍රිම නොලැබීම.
- රට තුළ ඇති වී තිබෙන ආර්ථික අර්බුදය හේතුකොට ගෙන ඉදිකිරීම් හා සම්බන්ධ සංවර්ධන ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීමට සිදුවීම. (මිල උච්ඡාවචනය නිසා හා අමු ද්‍රව්‍ය හිඟය නිසා)

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ මට්ටම	15	11	04
තෘතීයික මට්ටම	23	11	12
ද්විතික මට්ටම	256	195	61
ප්‍රාථමික මට්ටම	101	82	19
එකතුව	**395**	**299**	**96**

06.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පුරප්පාඩුව පවතින තනතුරුවලට අදාල රාජකාරී සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව අතර බෙදාදීම මගින් අදාල රාජකාරී ආවරණය කර ගන්නා අතර, මෙම පුරප්පාඩුව පවතින තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා නියමිත බඳවා ගැනීම් ක්‍රම අනුගමනය කරනු ලැබේ. එසේම ආයතනයේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා මෙම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා -2022							
අනු අංක	**වැඩසටහනේ නම**	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාලසීමාව**	**සමස්ථ ආයෝජනය**		**වැඩසටහනේ ස්වභාවය (දේශීය (විදේශීය/**	**නිමවුම/ලබාගත් දැනුම**
				දේශීය	**විදේශීය**		
1	Olympic Solidarity Sports administration Course (OSSAC) - 2022	02	දින 04	රු. 40,000.00	_	දේශීය	
2	Bachelor in Science in Sports Fitness	02	අවුරුදු 02	රු. 375,000.00	_	දේශීය	
3	බැහැරගත පුහුණු වැඩමුළුව	40	දින 02	රු. 360,000.00	_	දේශීය	
ක්‍රීඩා ක්ෂේත්‍රයේ නොවන නිලධාරීන්ගේ පුහුණු පාඨමාලා - 2022							
අනු අංක	**වැඩසටහනේ නම**	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාලසීමාව**	**සමස්ථ ආයෝජනය**		**වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)**	**නිමවුම/ලබාගත් දැනුම**
				දේශීය	**විදේශීය**		
1	Diploma in Procurement Management and Contract Administration	1	අවුරුදු 01	රු. 100,000.00	-	දේශීය	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

- ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

මෙහිදී නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වීමෙන් සේවක හැකියාවන් සෘජුවම වැඩි දියුණු වෙයි. හැකියාව වැඩිවන විට සේවකයාගේ ආත්මාභිමානය, ආත්ම විශ්වාසය හා සේවක තෘප්තිය වැඩි වන අතර, එමඟින් සේවක අභිප්‍රේරණය වැඩි වේ. එමෙන්ම මෙම ගුණාංග හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යඵලය ඉහළ යනු ඇත. මේ අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් ලබා දීම තුළින් ආයතනයේ කාර්යසාධනය ඉහළ යනු ඇත.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	සකස් කර ඇත.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	සකස් කර ඇත		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	විගණන හා කළමණාකරණ කමිටුවේ දී අනුමත කර ඇත		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගනන පනතේ (40)4 උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	ඉදිරිපත් කර ඇත		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	ඉදිරිපත් කර ඇත		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	කමිටු හතරම පවත්වා ඇත		
8	**වත්කම් කලමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිලිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්බිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනයෙන් කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරීයෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල නොවේ	මේ වන විට කෙටුම්පත අනුමත කර ඇති අතර ඉදිරියේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධික්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල නොවේ	ඉදිරියේ දී ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරනු ලබයි.	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		